මෙල්බන් ශ්‍රී ලංකා සංස්කෘතික සබඳතාවේ සංකේතයකි

කඩවර යාගය

චලංක අතලගේ මෙල්බන් වේදිකාවට ගෙන එන ඓතිහාසික නර්තනාංගය

ජගත් ජේ එදිරිසිංහ

විගාමික ජීවිතය යනු මව්බිමේ අත්මුල් සිඳ බිඳගත් ජීවිතයක් යයි සිතන බොහෝ දෙනෙක් සිටිති. ඒ නොදැනුවත් කම නිසා ය. ලෝකයේ විසල් බව දිනෙන් දින ක්ෂය වෙමින් පවතියි. එහිසාම ශ්‍රී ලාංකිකයන් ලෙස අප හුරු කරගත්, අප අනුදත්, අප අගය කරන, සියලුම සංස්කෘතිකාංග දේශසීමා පරයා ලෝකය පුරා විසිරෙමින් පවතියි. සමහරවිටෙක විදෙස් ගත මේ සංස්කෘතිකාංග, මව්බිමේ පිළිලයක් සේ වැඩෙන වාණිජකරණයට පවා හසු නොවී, පියවි ආකාරයෙන් දැක බලා ගත හැකි වීමේ අත්දැකීම අපූරුම එකකි.

චලංක අතලගේ මෙල්බන් කේන්ද්‍රව සිය නිර්මාණ බිහිකරන නිර්මාණවේදියා කලා ලෝකයට ආගන්තුකයකු නොවේ. ඔහු මේ වන විට නිර්මාණ රැසක් බිහිකර වේදිකා ගත කර ඉබිදු නොහැවති ඉදිරියටම යමින් සිටින සංස්කෘතික දූතයෙකි. ඔහු පසුගිය වසරේ වේදිකා ගත කළ 'කඩවර යාගය' නර්තන රංගනය නැවත වතාවක් මෙල්බන් කරළියට ගෙනෙන්නට උත්සාහ කරමින් සිටියදී අපි ඔහු සමඟ ඒ පිළිබඳව කතා බහක නියැලුණෙමු.

'විදෙස්ගතව ජීවත් වුණත් අපේ දරුවන් දැරියන් තුළ අපේ සංස්කෘතිකාංග පිළිබඳ යම් දැනුමක් ඇති කිරීමත් ඔවුන් ඒවාට යොමු කිරීමත් මගේ ප්‍රධාන අරමුණයි' චලංක කියයි. 'ඒ එක්කම අපේ දේ පිළිබඳ වටිනාකම විගාමික ප්‍රේක්ෂකයන්ගේ සිතේ ඇතිකිරීමත් අපේ අරමුණක්.. විදෙස්ගතවූ පමණින් අපේ දේ පිළිබඳ තියෙන බැඳීම කිසිසේත්ම අඩු නොවන බව පෙන්වාදීමටයි මම උත්සාහ ගන්නේ'

කඩවර යාගය පළමු වේදිකා ගත කිරීමේදීම එය ඉතා ඉහළ අවධානයක් යොමු කරගත් නිර්මාණයක් බවට පත් විය. තෝරාගත් කතාවේ ප්‍රභලත්වය සහ ඒ වෙනුවෙන් නිර්මාණය කෙරුණු නර්තනාංග වල තිබූ උසස්බව මෙන්ම නිර්මාණය වේදිකාව මත ඉදිරිපත්කිරීමේ නව්‍ය විලාශයද එයට හේතුවී යයි මට සිතෙයි. අපේ සැබෑ ජන නර්තන සම්ප්‍රදාය හුරු කොට ගනිමින් මනා පරිචයකින් නිර්මිත කඩවර යාගය සැබැවින්ම දැවැන්ත නිර්මාණයක් විය.

අපේ ජනශ්‍රැතියේ එන කතා අතරින් වඩාත් ප්‍රභල කතාවක් ලෙස කඩවර දෙවියන් පිළිබඳ පුරාවෘත්තය සැළකිය හැකි ය. ලංකාවේ ප්‍රාදේශීය දෙවිවරුන් අතරින් මුල් තැනක සිටින කඩවර දෙවියන් පිළිබඳ මේ කතාවේ ඇති නාට්‍යෝචිත බව එය වේදිකා රංගනයක් ලෙසින් ඉදිරිපත්

කරන්නට මහතු පිටුවහලක් සපයයි. මේ බව මැනැවින් වටහාගෙන සිටින නිර්මාණකරුවා සම්පූර්ණ කතාව රංග කතාවට වෙන්කර වේදිකාව මත ප්‍රතිනිර්මාණය කරන ආකාරය ඉතා අපූරු ය. එසේ කළ හැකි වන්නේ තමන්ගේ කාර්යභාරය පිළිබඳ මනා වැටහීමක් අවබෝධයක් ඇති නිර්මාණකරුවකුට පමණකි ය.

මේ නිර්මාණයේදී වැදගත්ම කාරණයක් වන්නේ කතාවට අදාළ ඉතිහාසය, ඒ ඉතිහාසයට අදාළ වූ ප්‍රදේශය සහ ඒ වෙනුවෙන් නිර්මිත නර්තනාංග වල ඉතිහාසය වැනි සියලුම කාරණා පිළිබඳව අත්දැකීමක් සහභාගිවූ දරු දැරියන්ට ලබා දීමට නිර්මාපකයා ගත් උත්සාහයයි. වසර ගණනාවක් තිස්සේ ඔහු යටතේ නර්තනය හදාරා ඇති මේ දරු දැරියන් තමන් සහභාගිවන නිර්මාණයේ ඇතුලාන්තය පිළිබඳ දැනුම්වත් කිරීමෙන් අපේ කම පිළිබඳ වටිනාකම පමණක් නොව අපේ ඉතිහාසයේ සැඟවුණු රසවත් කම පිළිබඳ වැටහීමක්ද ඔවුනට ලබා දීමෙන් ඔවුනට නිර්මාණය තිබී ලෙස ග්‍රහණය කරගන්නටද අවකාශයක් ලැබෙයි.

කඩවර යාගය නැවත වේදිකා ගතවන්නේ යම් යම් වෙනස්කම් කීපයක් සහිතව ය. පළමු වේදිකාගත කිරීමේදී ලබාගත් අත්දැකීම් අනුවත් ලද ප්‍රතිචාර වලට අනුව නිර්මාණය තවත් හිවු මට්ටමකට ගෙන එන්නට තමන්ට හැකි වූ බව චලංක කියයි.

'මේ වතාවේදී අපි තවත් ඉදිරියට ගියා කියලා මට හිතෙනවා. නර්තනාංග නිර්මාණයේදී පවා අපි තවත් අලුත් දේ එකතු කළා. විශේෂයෙන් මට හිනෑ කළා මා නොදකින පැත්තක් මගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දකිනවා නම් ඒ අයට ඉඩක් දෙන්න. ඒ අනුව මේ වසරේ මගේ ජ්‍යෙෂ්ඨම ශිෂ්‍යාවන් අට දෙනෙකුට මම අවස්ථාව දුන්නා රංගනයේ යම් යම් නර්තනාංග නිර්මාණය කරන්නට. එය ඉතාම සාර්ථක බව මට පෙනෙනවා. මගේ ශිෂ්‍යාවන් ඒ තත්ත්වය දක්වා ඒමට හැකිවීම ගැන මම ඉතා තිගතමානීව සතුටු වෙනවා.. ඒ එක්කම මේ වසරේ මට තවත් විශාල අභියෝගයක් තියෙනවා. ඒ තමයි 140ක් පමණ වන දරු දැරියන් රැසක් වේදිකාව මත හැසිරවීමේ අභියෝගය.. පුංචි දරුවන්ගේ බලාපොරොත්තු කඩනොකර ඔවුන්ට මට දිය හැකි හැම අවස්ථාවක්ම දෙන්නට මම උත්සාහ කරනවා '

කඩවර යාගය නැවත වතාවක් වේදිකා ගත වන්නේ වික්ටෝරියා රජයේ අනුග්‍රහය යටතේ වීම ඉතා වැදගත් කාරණාවකි. ඒ, අපේ සංස්කෘතියේ හරස් කඩක් වූ මෙවන් වේදිකා ප්‍රසංගයකට එවැනි අනුග්‍රහයක් වික්ටෝරියා රජයෙන් මෙයට පෙර කෙරුණ බවක් අප නොදන්නා නිසා ය.

'ඇත්තටම මේක විශේෂ අනුග්‍රහයක්. මොකද වික්ටෝරියා රජයට ඉදිරිපත්ව තිබූ යෝජනා අතර මෙවැනි සංස්කෘතිකාංග වෙනුවෙන් අනුග්‍රහය ඉල්ලලා ඉදිරිපත් වුණ යෝජනා තිබුණේ හැති තරම්. මම ඒ අයට කිව්වේ මම අපේ සංස්කෘතිකාංග අපේ ජනතාව වෙතට ගෙන යමින් ඉන්නේ. ඒ වෙනුවෙන් අනුග්‍රහය දක්වන්න කියන කාරණයයි. ඔවුන් ඒක පිළිගත්තා. එය මට විශාල සතුටක්. ඒ එක්කම මේ ප්‍රසංගයේ ටිකට් පත් 200 ක් අපේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙන නොමිලයේ නිකුත් කරන්නටත් මම කටයුතු යොදා තියෙනවා. ඒ එක්කම මම බලාපොරොත්තුවෙනවා ඕස්ට්‍රේලියානු ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිරිසකටත් නොමිලයේ මේ රංගනය නරඹන්න අවස්ථාව සළසා දෙන්න'

චලංක අතලගේ නිර්මාණවේදියාගේ සංස්කෘතික මෙහෙවර වේදිකා නිර්මාණ අතලින් නොනවතියි. ඔහුගෙන් නර්තනය හදාරණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් තිබී මගපෙන්වීමකින් ප්‍රභුව සැබෑ ශ්‍රී ලාංකික සංස්කෘතිකාංග කෙරෙහි යොමු කරවීමට ඔහු දක්වන උත්සාහය අගය කළ යුතු ය. එහිදී තිබී ප්‍රමිතියකට අනුගත වූ අධ්‍යාපනයක්, අත්දැකීමක්, සිය සිසු දරු දැරියනට ලබා දීමට ඔහු උනන්දු වෙයි. මේ ශීර්ෂ පළඳනා මංගලය, අවුරුදු 10 ක් මෙල්බන් නගරයේ ශ්‍රී ලාංකික සංස්කෘතිය වෙන්වෙන් කැප වුණ චලංක ගේ ගමනේ විශේෂ සන්ධිස්ථානයකි.

'නොවැම්බර් 23 දා මගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යාවන් 8 දෙනෙක් ශීර්ෂ පළඳනා පළඳිනවා. මේක පුළුවෙශ් අවස්ථාවක්. මේ ශිෂ්‍යාවන් මගේ ළඟ අවුරුදු අටකට වඩා වැඩි කාලයක් පුහුණු වුණ අය. මේ අවස්ථාව නොවැම්බර් 23 වන දා රාත්‍රියේ සියලු සම්ප්‍රදායික අංග සමග බෙරින් පන්සලේදී ඉතා දැවැන්ත මංගලයයක් හැටියට පවත්වන්න සියල්ල සූදානම් කර තියෙනවා. මේ ශිෂ්‍යාවන් මා යටතේ ලද අධ්‍යාපනයට අමතරව ලංකාවේ ජ්‍යෙෂ්ඨ නර්තනාචාර්යවරුන් යටතේ විවිධ නර්තන ක්‍රම හැදෑරීමට මම අවස්ථාව ලබාදුන්නා. ජ්‍යෙෂ්ඨ පාරම්පරික නර්තනාචාර්යවරුන් වන ප්‍රසන්න රූපතිලක සහ ප්‍රසන්න රූපතිලක යටතේ ශිල්ප හැදෑරීමටත් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ නර්තනාචාර්ය දීපාලි ගුණසේන ගුරුතුමා යටතේ සංතාරිය පිළිබඳ ඉගෙනගන්නටත් මං මගේ ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබා දුන්නා. ඊට අමතරව චිත්‍රසේන කලායතනයේ සහ චන්දන වික්‍රමසිංහ කලායතන වල ඉගැන්වීම් පිළිබඳවත් අධ්‍යයනයක් කරන්නට අවස්ථාව ලබා දුන්නා. ඒ නිසා මේ අය මේ ශීර්ෂ පළඳනා ලබා ගන්නේ දැනුමින් හා අත්දැකීමෙන් ඉතා පොහොසත් තැනක සිටිමිනුයි. මේ එළිමහන් රාත්‍රී මංගල්‍යයට ලංකාවෙන් බෙර වාදන ශිල්පීන් අට දෙනෙකුත් සහභාගි වෙනවා. පමණක් නෙවෙයි දහසකට වැඩි පිරිසකටත් අපි ආරාධනා කරන්නට යනවා මෙය නරඹන්න එන ලෙස'

චලංක අතලගේ මේ යමින් සිටින්නේ ඉතා වෙහෙසකර ගමනකි. විගාමික ශ්‍රී ලාංකික ජන ප්‍රජාව වෙනුවෙන් අපේ සංස්කෘතිකාංග ඒ හැටියටම පවත්වාගෙන යාමේ චලංකගේ උත්සාහය අගය කළ යුතුවන්නේ ඒ වෙනුවෙන් කළ යුතු කැපවීමේ තරම වටහා ගත හැකි නිසා ය. මේ ගමනේ බොහෝ දුර යන්නට ඔහුට ශක්ති හා ධෛර්යය තිබෙන බව අපි දනිමු.